# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1993/8 - 2016 නොවැම්බර් මස 15 වැනි අඟහරුවාදා - 2016.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, බුළුවේමුදුන සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 03 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1249.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 709, ලුණුකැටියාමඩිත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු උපාලි සී. රාජපක්ෂ මහතා විසින් මැන සකස් කරන ලද, අංක 982 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 න් කොටසක් ලෙස දක්වෙන, ''ලුණුකැටියාමඩිත්ත හේන'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 55 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

ඉඩමේ නම : ලුණුකැටියාමඩිත්ත හේන
ප්‍රමාණය : පර්චස් 55

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාලා විජේසිරි, මහින්ද විජේසිරි හා බන්දුල විජේසිරි යන අය හිමිකම් කියන ඉඩම (අංක 1653 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 3) ; |
| *නැගෙනහිරට* | : | බුළුවේමුදුන සිට ලුණුකැටියාමඩිත්ත දක්වා දිවෙන මාර්ගය ; |
| *දකුණට* | : | අංක 982 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 2 (එන්. ආරියරත්න හිමිකම් කියන ඉඩම) ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

1A - G 24557 — 17 (2016/11)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 1. නිල්මිණි මල්රුක්ෂි ආරියරත්න මහත්මිය,
අංක 15, පන්සල පාර,
ලියන්ගස් වගුර,
පන්විල.

12 - 28

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, බුළුවේමුදුන සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත් කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 03 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1248.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 709, ලුණුකැටියාමඩිත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත ගමේ පිහිටි, ''ලුණුකැටියාමඩිත්ත හේන'' නැමති ඉඩමට බලය ලත් මිනින්දෝරු ටී. පියසේන මහතා විසින් මැන සකස් කරන ලද, අංක 1653 දරන බලය ලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6 දරන ඉඩමෙන් කොටසක් ලෙස දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් පර්චස් 12 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

ඉඩමේ නම : ලුණුකැටියාමඩිත්ත හේන
ප්‍රමාණය : පර්චස් 12

මායිම් :

*උතුරට* : අංක 1653 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6 හි ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : අංක 1653 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4 හා 5 හි කොටසක් ;
*දකුණට* : බුළුවේමුදුන සිට දෙල්ගස් ලන්ද දක්වා දිවෙන මාර්ගය ;
*බටහිරට* : අංක 1653 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4 හා 5.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 1. මාලනී ආරියරත්න මහත්මිය,
අංක 13, පන්සල පාර,
ලියන්ගස් වගුර,
පන්විල.

2. නිල්මිණි මල්රුක්ෂි ආරියරත්න මහත්මිය,
අංක 15, පන්සල පාර,
ලියන්ගස් වගුර,
පන්විල.

හා තවත් අය

12 - 29

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.